| සුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | ZEOM කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட<br>Zonal Education Office - Minuwangoda |
|---|---|

| | | |
|---|---|---|
| | | **වාරය - II** |
| **ශ්‍රේණිය : 9** | **විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය** | **පාඩම : 7- දෑසේ නිල් පැහැය** |

## ❖ කතුවරයා පිළිබඳ විශේෂ තොරතුරු

- නිදහස් කවියේ ද්වීතිය තරංගයට අයත් කවියෙකු ලෙස දයාසේන ගුණසිංහ මහතා විසින් රාජ්‍ය සාහිත්‍යයෙන් පිදුම් ලද "රන් තැටියක කඳුළු" ග්‍රන්ථයෙන් මෙම පැදිපෙළ උපුටා ගෙන ඇත

- එතුමා කවියෙකු, කෙටි කතාකරුවෙකු, පුවත්පත් කලාවේදියෙකු, හා භාෂා පරිවර්තකයෙකු
  ලෙස දක්ෂතා එළි දක්වා ඇත.

- දයාසේන ගුණසිංහ මහතාගේ වෙනත් කාව්‍ය ග්‍රන්ථ -
  දොරමඩලාව, නොවදිමි සිදුහත්, කුණාටුව
  කෙටි කතා - කැනල් පාරේ  නිශාචරයෝ, කේතුමති හෝටලයේ රාත්‍රියක්

## ❖ පාඩමේ අන්තර්ගතය කෙටියෙන්

- දිළිඳු පවුලක ජීවන අපේක්ෂා මෙම පද්‍ය පන්තිය වස්තු විෂය කොටගෙන ඇත.

- දිළිඳු බවින් පීඩා විඳින නමුත් පවුලේ අන්‍යෝන්‍ය සබඳතා, ගරුත්වය ශක්තිමත් බව කාව්‍යයෙන් කියැවේ.

- ව්‍යංගාර්ථ හෙවත් මතුපිටෙන් පෙනෙන අර්ථයට වඩා වෙනස් අරුත් ප්‍රකාශ කිරීමේ පද්‍ය පන්තියෙන් දැක්වේ.
  උදා :  දෑසේ නිල් පැහැය සෙමෙන් අඳුරට දියවිය නොදැනිම

- කාව්‍යෝක්ති හෙවත් නිර්මාණය රසවත් කර ගැනිමට යොදන උපක්‍රම ලෙස
  නිල් ඉඳුවර නිලේ අරුම .........................
  ඇත දියඹ නිලේ වරුණ ........................
  ආදි යෙදුම් දැක්වේ.

- ලේඛන ව්‍යවහාරයේ යෙදෙන වදන් බහුලව දක්නට ලැබේ.
  උදා :  නිල් ඉඳුවර, හිරු අවරින්,

- රූපකාර්ථ යෙදුම් ලෙස
  හද මිරිකා       කඳුළට
  ඉදෙන බතේ සිනා හඬට

- දිළිඳුකමේ දුෂ්කරතා සංකේතාත්මකව දැක්විය හැකිය.
  උදා: නිදි පැදුරේ ..........................
  නගන සුසුම් කෙදිරිලි හඬ
- ඔවුන්ගේ ජීවිත වලට ආලෝකයක් ලබා දීම තම දුවට අනාගතයේ හැකිවනු ඇතැයි බලාපොරොත්තු තබා ගනියි.
  ඉහත අනුව පද්‍ය රස වින්දනයට යොමු වන්න.

❖ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. “දැසේ නිල් පැහැය” පද්‍ය පන්තියේ රචකයා නම් කරන්න.
2. මෙම කාව්‍ය නිර්මාණය උපුටා ගෙන ඇත්තේ කුමන කාව්‍ය සංග්‍රහයෙන් ද ?
3. මෙම කාව්‍ය නිර්මාණය රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලැබුවේ කුමන වර්ෂයේ ද ?
4. දයාසේන ගුණසිංහ කවියාගේ වෙනත් කාව්‍ය නිර්මාණ දෙකක් ලියන්න.
5. “දැසේ නිල් පැහැය” කාව්‍ය නිර්මාණය රචනා කර ඇති කාව්‍ය ආකෘතිය දක්වන්න.

<u>විශේෂණ පද</u>

විශේෂණ පද නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ ලෙස වර්ග දෙකකි.

නාම පදයක් වර්ණනා කිරීම සඳහා නාම විශේෂණ භාවිතා වේ.

උදා : සුදු මල උස ළමයා

“සුදු” සහ “උස” යනුවෙන් දැක්වෙන්නේ නාම විශේෂණ පදයි.

ක්‍රියා පදයක් වර්ණනා කිරීම සඳහා ක්‍රියා විශේෂණ පද භාවිතා වේ.

උදා : වේගයෙන් දුවයි.

ඉකි ගසමින් හඬයි

“වේගයෙන්” හා “ඉකි ගසමින්” යනුවෙන් දැක්වෙන්නේ ක්‍රියා විශේෂණ පදයි.

❖ පහත වාක්‍යවල නාම විශේෂණ පද තෝරා ඉදිරියෙන් ලියන්න.

1. පුංචි දරුවා සිනාසෙයි. ..............................................
2. අරලිය මල් බිම වැටෙයි ..............................................
3. විශාල ගස් සුළඟට වැටෙයි ..............................................

❖ පහත වාක්‍ය වල ක්‍රියා විශේෂණ පද තෝරා ඉදිරියෙන් ලියන්න.

1. අම්මා දියණියව ආදරයෙන් පෝෂණය කරයි. ....................................................
2. කථිකයා ආවේගශීලිව කතා කරයි. ....................................................
3. ළමයි නිහඬව අභ්‍යාස කරති ....................................................

❖ පහත සඳහන් වැකිවල යෙදෙන නාම විශේෂණ හෝ ක්‍රියා විශේෂණ පදය තෝරා යටින් ඉරක් අදින්න.

1. යහපත් ළමයි පව් නොකරයි ...............................................
2. ගංගාව වේගයෙන් ගලා බසියි ...............................................
3. කුරුලු නාදය කන් පිනවයි ..............................................
4. මැටි භාණ්ඩ භාණ්ඩ බිඳෙන සුලුයි .............................................
5. කාලය සෙමෙන් ගෙවී යයි ..............................................

❖ පහත සඳහන් නාම පද හා ක්‍රියා පද වලට විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍ය ලියන්න.

| නාම පද | ක්‍රියා පද |
|---|---|
| 1.ගුරුතුමිය | 1. කඩයි |
| 2.පොත | 2.අවබෝධ කරයි |
| 3.සිසුවා | 3.මගපෙන්වයි |

## කවි ලියමු

රසවත් වැකිය කවියයි.භාෂාව භාවිතයෙන් කවිය නිර්මාණය කරයි.උපමා, රූපක ,ව්‍යංගාර්ථ භාෂාව, අනුප්‍රාසය ආදී අර්ථය ශබ්ද රස යොදා ගැනීමෙන් කවිය රසවත් හා අර්ථවත් කර ගත හැකිය.

පහත මාතෘකාව යටතේ පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න.(කවි 6-8 ක් පමණ සෑහේ.)

❖ කුරුලු ලොවේ තම මව පියා සමග සෙනෙහසින් සිටි කුරුලුපැටියකු ඔවුන්ගෙන් මිදී තනිව පියාසලා අවට නරඹා නැවත පැමිණි පසු තමා තුළ ඇතිවු හැගීම් සහ දුටු පරිසරය දෙමවුපියන්ට විස්තර කරන ආකාරය කවියෙන් ලියන්න.

එස් .ඒ.කේ. ජයන්තා මිය - ගුරු උපදේශිකා (සිංහල)